# පුතෙකු හමුවීම




බිරිඳ සැමියා දෙස බියෙන් හා සැකයෙන් බැලුවාය. මුලදී සිනාසීමට ඇයට අවශ්‍ය විය. "මොකද ඔළුව නරක් වෙලා ද?" කියා සැමියාගෙන් ඇසීමට අදහස් කළ ඈ අන්තිම මොහොතේ දී යන්තම් හිත මැඩ ගත්තාය.

**චෙන්ගීස් අයිත්මාතව්**

ගෙදර පැමිණි වෝඩන් කෙරෙහි කිසියම් අමුත්තක් පෙනෙන්නට තිබිණි. යම් කිසි දෙයකින් ඔහුගේ සිත අවුල්වන්නට ඇත. නැතිනම් තැතිගන්නට ඇත. අනෙක් අතින් ඔහු අධෛර්යට පත් වී සිටියේය. ශෝකයෙන් වෙලී සිටියේය. කිසියම් අවුලක් සිදු වී ඇතැයි ඔහුගේ බිරිඳ ඒවෙලේම සැක කළාය. ටිකින් ටික කරුණු විමසා දැන ගත් ඈ ඉන් කොතරම් තෝන්තු වූවා ද කියතොත් කුමක් කළ යුතුදැයි නොදත්තාය. ඔහුගේ හිසේ කිසියම් අරුම පුදුම අදහසක් පහළ වී තිබේ. බැලූ බැල්මට එය මහල්ලකුගේ විකාර අදහසක් මෙන් පෙනේ. නැතිනම් විහිළුවක් මෙන් පෙනේ. ඔබ කැමති දෙයකින් එය හඳුන්වන්න. එය සිහි බුද්ධිය තිබෙන කෙනෙකුට නම් කිසිසේත් ම ගැලපෙන්නක් නොවෙයි.

මීට අවුරුදු විස්සකට පමණ පෙර යුද පෙරමුණේ දී මිය ගිය පුතෙක් මහල්ලාට සිටියේය. මිය යන විට පුතාට එතරම් වයසක් නැත. පෙනෙන හැටියට මහලු වෝඩන් හැරෙන්නට අන් කිසිවෙකුට පුතා ගැන මතක ඇතැයි සිතිය නොහැකිය. බිරිඳ සමග වාසය කළ මුළු කාලය තුළ ම ඔහු කවදාවත් පුතා ගැන සඳහන් කළේ නැත. යුද්ධයට කලින් පුතා ගුරුවරයෙකු ලෙස රස්සාව කළ ගමට යාමට මහල්ලා හිටි හැටියේ ම තීරණය කෙළේය.

බිරිඳ සැමියා දෙස බියෙන් හා සැකයෙන් බැලුවාය. මුලදී සිනාසීමට ඇයට අවශ්‍ය විය. " මොකද ඔළුව නරක් වෙලා ද?" කියා සැමියාගෙන් ඇසීමට අදහස් කළ ඈ අන්තිම මොහොතේ දී යන්තම් හිත මැඩ ගත්තාය. ඔහු කතා කළ ආකාරය ඔහුගේ නෙත් තුළ දක්නට තිබුණු සන්සුන්පැහැපත් බැල්ම, කතාවෙන් පළ වූ ස්ථිර විශ්වාසය හා අවබෝධය හා ස්වරයෙහි තිබුණු සත්‍යතාවය දුටු ඈ සැමියා සැබෑ විශ්වාසයකින් කතා කරන බව තේරුම් ගත්තාය. එසේ නම් ඔහු කතා කරන්නේ හොඳ සිහියෙන් විය යුතුය. ඔහුගේ ආශාව කොතරම් හාස්‍ය ජනක වුවත්, කොතරම් න්‍යාය විරෝධී වුවත්, දුඹුරු පාට මුහුණක් ඇති මේ මිනිහාට, සම රැලි වැටුණ කාරුණික දෑසක් ඇති මේ මිනිහාට, පුළුන් කැල්ලක් වැනි රැවුලක් හා ලොකු මාළු කූරියන් දෙදෙනෙක් මෙන් දන හිස මත තබාගෙන සිටින විඩාපත් ලොකු දෑතක් ඇති මේ මිනිහාට, ළමයෙකුට මෙන් අවමන් කිරීම පවක් යැයි ඈ ඒ මොහොතේදී ම කල්පනා කළාය. ඈ සැමියා ගැන කනගාටු වූවාය. එහෙත් ඔහුගේ හදිසි ආශාව අනුවණ කමක් බව ඈ දැන සිටියාය.

"එහෙනම් ඇයි මීට කලින් පුතා බලන්නට ගමට නොගියේ?" ඈ පරිස්සමෙන් ඇසුවාය.

"මං දන්නේ නැහැ!"යි වෝඩන් සුසුමක් හෙළමින් කීවේය. "නමුත් දන්නම් යන්න ලොකු ආශාවක් තියෙනවා. කොහොම නමුත් මැරෙන්න කලින් ගිහින් එන්න ඕන. මම හෙට උදේ පාන්දරින් පිටත් වෙනවා."

"කැමැත්තක් කරන්න. ඒ ක ඔහේට අයිති වැඩක්."

සැමියා සිය අදහස් යළි වෙනස් කරන්නට පිළිවනැයි ඈ විශ්වාස කළාය.